දකුණු පළාත් සභාව - 2019
-------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

දකුණු පළාත් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 30 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 07 දින නිකුත් කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට දකුණු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

1.2.1 ගණකාධිකරණ අඩුපාඩු
---------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | පළාත් අරමුදල් ගිණුමේ සටහන අංක 05 අනුව 2019 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොගය ගිණුම්ගත කිරීමේදී ගාල්ල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ රු.3,545,408 ක් වූ ඉතිරි ලිපිද්‍රව්‍ය තොගය ඇතුලත් නොකිරීම හේතුවෙන් පළාත් අරමුදල් ගිණුමේ දක්වා ඇති ජංගම වත්කම් ශේෂය ඊට සමාන වටිනාකමකින් ඌණ ගණනය වී තිබුණි. | පළාත් සභාවේ සියළුම ආයතනවල ඉතිරි තොග ගිණුම්ගත කළ යුතු වේ. | මූලාශ්‍ර ලේඛන මත පදනම්ව ලිපිද්‍රව්‍ය තොග ගිණුම්ගත කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ii) | දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිෂ්පාදන අත්තිකාරම් ගිණුම අනුව 2019 දෙසැම්බර් 31 දිනට තොග වටිනාකම රු.174,299,925 ක් වුවද, පළාත් අරමුදල් ගිණුමේ සටහන අංක 5 අනුව එම වටිනාකම රු.161,931,286 ක් වූ බැවින් අරමුදල් ගිණුමේ දක්වා ඇති ජංගම වත්කම් ශේෂය රු.12,368,639 කින් ඌණ ගණනය වී තිබුණි. | ඉතිරි තොගය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | පළාත් භාණ්ඩාගාරයට අඩුවෙන් තොග වටිනාකම දන්වා එවීම පිළිබඳ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් හේතු විමසීමට ඉදිරියේදී කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ අපහරණය කරන ලද දේපල පිරියත හා උපකරණ වලට අදාළ රු.25,776,123 ක සමුච්චිත ක්ෂය, සමුච්චිත ක්ෂය ගිණුමෙන් ඉවත් නොකර වර්ෂයේ ක්ෂය වියදමෙන් අඩු කිරීම හේතුවෙන් අරමුදල් ගිණුමේ ඇතුලත් වර්ෂයේ ඌණතාවය සහ දේපල පිරියත හා උපකරණ ශේෂය ඊට සමාන වටිනාකමකින් ඌණ ගණනය වී තිබුණි. | වසරේ ක්ෂය වියදම නිවැරදිව ගණනය කළ යුතුය. | විගණන නිරීක්ෂණය පිළිගනිමි. නිවැරදි කර ගිණුම්වලට ගැලපීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ නොපියවූ අග්‍රිම ශේෂය රු.354,996,842 ක් වූ නමුත් පළාත් අරමුදල් ගිණුමේ සටහන අංක 08 අනුව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ නොපියවූ අග්‍රිම ශේෂය රු.359,400,552 ක් වූ බැවින් පළාත් අරමුදල් ගිණුමේ දක්වා ඇති ජංගම වත්කම් ශේෂය රු.4,403,710 කින් අධි ගණනය වී තිබුණි. | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ නොපියවූ අග්‍රිම ශේෂය, පළාත් අරමුදල් ගිණුම සමග සැසඳී තිබිය යුතුය. | ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා කාර්යාල 03 හා බලපිටිය, තංගල්ල මූලික රෝහල් 02 හි පොත් අනුව ගැලපූ පසු, අග්‍රිම ගිණුමේ ශේෂය ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (v) | අරමුදල් ගිණුම අනුව අධිකාරී දෙකකට 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය රු.119,277,191 ක් වුවද එම ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු ශේෂය රු.139,217,696 ක් වූ බැවින් අරමුදල් ගිණුමේ දක්වා ඇති ජංගම වගකීම් ශේෂය රු.19,940,505 කින් ඌණ ගණනය වී තිබුණි. | ගෙවිය යුතු මුදල් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | විගණන නිරීක්ෂණය පිළිගනිමි. ගෙවිය යුතු ශේෂ නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (vi) | පළාත් සභාව යටතේ ඇති ශීර්ෂ 25 කට අයත් එක් එක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ දේපල පිරියත හා උපකරණවල 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.10,653,262,621 ක්වූ අතර එදිනට පළාත් අරමුදල් ගිණුමේ දක්වා ඇති ශේෂය රු.11,166,824,576 ක් වූයෙන් ඒ දෙක අතර රු.513,561,955ක නොසැසඳු වෙනසක් නිරීක්ෂණ විය. | අරමුදල් ගිණුම හා ශීර්ෂවල දේපල පිරියත උපකරණ වලට අදාළ ශේෂයන් සැසඳී තිබිය යුතුය. | ශීර්ෂ 25 න් ගෙන්වා ගනු ලබන මූලාශ්‍ර ලේඛන පදනම් කරගෙන වත්කම් ගිණුම්ගත කර ඇති බව සඳහන් කරමි. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදි. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දකුණු පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යායුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයිම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම,

  මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(I) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 අනුකූල නොවීම්

### 1.6.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ | | | |
| (i) VIII පරිච්ඡේදයේ 10 වැනි ජේදය හා 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ප්‍රධාන අමාත්‍යාංශ නිලධාරීන් සතියේ දිනවල රාජකාරියට වාර්තා කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කර තිබුණ ද සති අන්තයේ හා රජයේ නිවාඩු දිනවලදී එලෙස කටයුතුකර නොතිබියදී ඔවුන්ට, අතිකාල හා නිවාඩු දින දීමනා රු.914,624ක් ගෙවා තිබුණි. | ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් සෑම දිනකම පැමිණීම හා පිටවීම සනාථ කළයුතුය. | විගණනයෙන් පෙන්වා දීමෙන් පසුව සෑම දිනකම ඇඟිලි සලකුණු යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශ ලේකම් උපදෙස් දෙන ලදි. |
| (ii) XIX පරිච්ඡේදයෙහි 5.2.1 උප ජේදය හා 2016 අගෝස්තු 26 දිනැති අංක 04/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ වාලිමවුන්ට් කර්මාන්ත පුරයෙහි පිහිටි රජයේ නිල නිවාසයෙහි පදිංචි නිලධාරියෙකුගෙන් සියයට 12½ බැගින් නිවාස කුලී අය නොකිරීම නිසා 2007 වර්ෂයේ සිට 2019 ජූලි මස දක්වා අයකරගෙන නොතිබුණු නිවාස කුලිය රු.331,846 ක් විය. | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.2.1 උප ඡේදය හා 2016 අගෝස්තු 26 දිනැති අංක 04/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | 2007 වර්ෂයේ සිට 2019 ජූලි දක්වා හිඟ නිල නිවාස කුලී අයකිරීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ලැබීමට නියමිත අතර 2019 අගොස්තු මස සිට මාසිකව මූලික වැටුපෙන් සියයට 12.5ක් අයකරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (iii) XXI පරිච්ඡේදයේ 1.1 උප ඡේදය | නිල ඇඳුම් දීමනා හිමි නිලධාරීන් ගණයට අයත් නොවන ගුරුවරුන් සඳහා නිළ ඇඳුම් සපයා ගැනීමට රු.157,706,458 ක් ගෙවා තිබුණි. | ආයතන සංග්‍රහයේ XXI පරිච්ඡේදයේ 1.1 උප ඡේදය අනුව කටයුතු කළ යුතුය. | මෙම දීමනාව ගෙවා ඇත්තේ දකුණු පළාත් අමාත්‍ය මණ්ඩල තීරණ අංක 806 යටතේ බව සඳහන් කරමි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | ආයතන 05 කට අදාළ වටිනාකම රු.28,682,581ක් වූ වර්ෂ 02 ක කාලයක් ඉක්ම වූ පොදු තැන්පතු ශේෂ 228 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කල යුතුය. | රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරමි. |
| (ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ --------------------- | | | |
| (i) 2017 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2017 | විශේෂිත රාජකාරී සඳහා නිලධාරියෙකු ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ හෝ ගණන්දීමේ නිලධාරියාගේ පූර්ව අනුමැතිය ඇතිව අධිවේගී මාර්ගය භාවිතා කළ අවස්ථාවකදී, ඒ සඳහා භාවිතා කළ වාහනය වෙනුවෙන් ගෙවූ ප්‍රවේශපත්‍ර ගාස්තුව ප්‍රතිපූර්ණය කළ හැකි නමුත් දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට දෛනික සාමාන්‍ය රාජකාරී සඳහා නිවසේ සිට කාර්යාලයට පැමිණීමේදී අධිවේගී මාර්ගය භාවිතා කිරීම වෙනුවෙන් රු.137,250 ක ප්‍රවේශ පත්‍ර ගාස්තු ප්‍රතිපූර්ණය කර තිබුණි. | 2017 පෙබරවාරි 17 දිනැති අංක 02/2017 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | හදිසි හා අත්‍යවශ්‍ය රාජකාරී සඳහා පැමිණිය යුතු අවස්ථාවලදී පමණක් එම මුදල් ප්‍රතිපූර්ණය කරගෙන ඇති බව සහ නිවාඩු දිනවල සාමාන්‍ය රාජකාරියට පැමිණීමේදී කිසිදු දිනක අධිවේගී මාර්ගයක ගෙවන ලද මුදල් ප්‍රතිපූර්ණය කර ගෙන නොමැති බව සඳහන් කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 2019 මැයි 31 දිනැති අංක 13/2008(v) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | පළාත් ප්‍රධාන ලේකම්වරුන්ට නිල වාහන සඳහා ඉන්ධන සැපයීමේදී රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අනුව ඉන්ධන දීමනා ලබාගත යුතු වුවත්, දකුණු පළාතේ 2019 මැයි 16 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 02-2019 අනුව නිල වාහන සඳහා ලබාගන්නා ඉන්ධන ප්‍රමාණය වැඩිකර තිබුණි. | 2019 මැයි 31 දිනැති අංක 13/2008(v)දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 02-2019 ප්‍රකාරව අදාළ ඉන්ධන සීමාවට යටත්ව ඉන්ධන දීමනා ලබා ගන්නා ලදී. |
| (iii) | 2009 මාර්තු 05 දිනැති අංක 2007/10 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දකුණු පළාත් හිටපු කෘෂිකර්ම අමාත්‍යවරයාට 2004 වසරේ සිට 2019 වසරේ අප්‍රේල් මස දක්වා නිල නිවාස දීමනා වශයෙන් රු.3,000,000 ක් 2019 අප්‍රේල් 22 දින ගෙවා තිබූ නමුත් මෙම කාල පරිච්ඡේදයේ එම අමාත්‍යවරයා ගාල්ල ප්‍රදේශයෙහි ස්ථිර පදිංචි ස්ථානයේම පදිංචිවී සිට ඇති බව අනාවරණය විය. | 2009 මාර්තු 05 දිනැති හා අංක 2007/10 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කටයුතු කල යුතුය. | ආණ්ඩුකාරතුමාගේ විධිමත් අනුමැතිය ලබාගෙන පළාත් මූල්‍ය රීති 64 අනුව ගෙවීම් කර ඇත. |

(ඇ) පළාත් මූල්‍ය රීති
------------------

| | | | | |
|---|---|---|---|---|
| (i) | 261.2 | තත්කාර්ය අතුරු අග්‍රිමයක් වශයෙන් එක් අවස්ථාවකදී ලබාදිය හැකි මුදල රු.100,000 කට වැඩි නොවිය යුතු අතර අත්‍යාවශ්‍ය අවස්ථාවක දී ප්‍රධාන ලේකම්ගේ පූර්ව අනුමැතිය ඇතිව මෙම සීමාව ඉක්මවා අතුරු අග්‍රිම නිකුත් කළ හැකි වුවද, එවැනි අනුමැතියකින් තොරව දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 16 දෙනෙකු සඳහා 2019 වර්ෂයේදී අවස්ථා 30 කදී රු.100,000 ට වැඩි අත්තිකාරම් රු.7,685,925 ක් ගෙවීම් කර තිබුණි. | පළාත් මූල්‍ය රීති 261.2 අනුව කටයුතු කල යුතුය. | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සෘජුව අත්තිකාරම් ලබා නොදී සරප් හරහා වැඩසටහන් සඳහා ගෙවීම් කරමි. දකුණු පළාත් සංවර්ධන අධිකාරිය පළාත් මූල්‍ය රීති 261.2 අනුව කටයුතු කරමි. |
| (ii) | 272.1 | බාහිර පාර්ශවයකට රු.2,000 ක් හෝ ඊට වැඩි මුදලක් ගෙවීමේදී එය මුදලින් නොගෙවිය යුතු වුවත් හුංගම ගොවිපල භූමියේ භෞතික ප්‍රාග්ධන වත්කම් ගොඩනැගීම හා සංවර්ධන ව්‍යාපෘතියේ රු.3,389,406 ක සියළු වියදම් දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ නමට ලියන ලද මුදල් චෙක්පත් මඟින් සිදුකර තිබුණි. | පළාත් මූල්‍ය රීති 272.1 අනුව කටයුතු කල යුතුය. | පළාත් මූල්‍ය රීති 272.1 අනුව කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | 283.4 | ආයතන 02 ක බැංකු ජංගම ගිණුම් 08 කට අදාළව නිකුත්කළ නමුත්, ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ක් ඉක්මවූ වටිනාකම රු.3,103,680 ක චෙක්පත් 34 කට අදාළව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පළාත් මූල්‍ය රීති 283.4 අනුව කටයුතු කල යුතුය. | චෙක්පත් කිහිපයක් නිරවුල්වී ඇති අතර, නිරවුල් නොවූ චෙක්පත් සඳහා පිළිතුරු පසුව ඉදිරිපත් කරමි. |

**1.7 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

---------------------------------------------------------

**සීමා නොපිළිපැදීම්**

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වාණිජ අත්තිකාරම් ගිණුම් | | |
| (i) සමාලෝචිත වර්ෂයට අදාළව අනුමැතිය ලබාදී තිබූ වියදමේ උපරිම සීමාව ඉක්මවූ අවස්ථා 02 ක් විය. | වාණිජ අත්තිකාරම් ගිණුම්වල සීමා අනුව කටයුතු කළ යුතුය. | ලබුදූව ගොවිපල අත්තිකාරම් ගිණුමේ වියදමේ උපරිම සීමාව ඉක්මවා ඇති බව පිළිගනිමි. වියදමේ උපරිම සීමාව තුළම ගනුදෙනු සිදු කිරීමට වගබලා ගැනීමට අවශ්‍ය උපදෙස් දෙන ලදි.<br>හම්බන්තොට රුහුණු රසාර අලෙවිසැලෙහි 2018 වර්ෂයේ ක්ෂය සංචිත අරමුදලට ගෙවිය යුතු ක්ෂය ප්‍රමාණයෙන් කොටසක් 2019 වර්ෂයේ මුදලින් ගෙවා ඇති බැවින් 2019 වර්ෂයේ වියදමක් නොවන බැවින් සීමා ඉක්මවා නොමැත. |

| | | |
|---|---|---|
| (ii) සමාලෝචිත වර්ෂයට අදාළව අනුමැතිය ලබාදී තිබූ ලැබීම්වල අවම සීමාවට ළඟා නොවූ අවස්ථා 02 ක් විය. | වාණිජ අත්තිකාරම් ගිණුම්වල සීමා අනුව කටයුතු කළ යුතුය. | තෙලිජ්ජවිල ගොවිපල අත්තිකාරම් ගිණුම අනුව තථ්‍ය වශයෙන් ලැබීම්වල අවම සීමාව වියදමේ උපරිම සීමාවට සමාන වීමෙන් බැර ශේෂයේ අවම සීමාව ඉක්මවා ඇත.<br>හම්බන්තොට රුහුණු රසාර අලෙවිසැල සීමා සංශෝධනය සිදු වන අවස්ථාවේදී සීමා කරා ලඟා වීමට හැකියාව පවතින බැවින් සීමා සංශෝධනය සිදු නොකරන ලදි. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමක අනුමැතිය ලබා දී තිබූ හර ශේෂයේ උපරිම සීමාව ඉක්මවා තිබුණු අවස්ථාවක් පැවතුණි. | සීමාවන් ඇතුළත කටයුතු කළ යුතුය. | හර ශේෂයේ උපරිම සීමාව ඉක්මවීම පිලිගනිමි. |

## 2. ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 හි පළාත් සභාව විසින් උපයාගෙන තිබූ බදු සහ බදු නොවන ආදායම් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ. | | |

| ආදායම් වර්ගය | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| බදු ආදායම | 7,497 | 8,184 | 7,724 | 6,440 | 5,654 |
| බදු නොවන ආදායම | 1,298 | 988 | 1,068 | 789 | 650 |
| එකතුව | 8,795 | 9,172 | 8,792 | 7,229 | 6,304 |

| | | |
|---|---|---|
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමලෝචිත වර්ෂයේ බදු ආදායම රු. මිලියන 687 කින් එනම් සියයට 8 කින් අඩුවී තිබුණු අතර, බදු නොවන ආදායම රුපියල් මිලියන 310 කින් එනම් සියයට 31 කින් වර්ධනය වී තිබුණි. | කළමනාකරණ තොරතුරු වේ. | විගණන නිරීක්ෂණ පිලිගනිමි. |

(ආ) හිඟ ආදායම්

--------------

| | | |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට දේපල පැවරීම මත හිඟ මුද්දර ගාස්තු ආදායම රු.මිලියන 451.01 ක් වූ අතර හිඟ ආදායමෙන් 2019 වර්ෂය තුළ අයකිරීමේ ප්‍රතිශතය සියයට 21.05 ක් හා නිදහස් කිරිමේ ප්‍රතිශතය සියයට 25.24 ක් විය. | හිඟ ආදායම් නිදහස් කිරීමේ ප්‍රතිශතයට වඩා අයකිරීමේ ප්‍රතිශතය ඉහළ අගයක් ගත යුතුය. | මුද්දර ගාස්තු ආරම්භක ශේෂය තුළ ඇස්තමේන්තු තක්සේරු, එකඟවීම් තක්සේරුවල සියයට 300 ක දඩයක් සහිත වේ. 2017-01 අභ්‍යන්තර චක්‍රලේඛය අනුව මෙම දඩය සියයට 10 ක් ලෙස හා අධිකරණ නඩු පැවරීම් සඳහා සියයට 25 ක් ලෙස අඩුකර ඉතිරිය නිදහස් කර ඇත. සියයට 300 ක දඩ අන්තර්ගත තක්සේරු නිදහස් කිරීමේදී ඉහළ අගයක් ගන්නා බැවින් රැස්කිරීම් ප්‍රතිශතයට වඩා නිදහස් කිරීමේ ප්‍රතිශතය ඉහළ අගයක් ගෙන ඇත. |

3. මූල්‍ය සමාලෝචනය

----------------------

මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.1,279,965,187 ක ඌණතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.585,671,505 ක් විය. සමාලෝචිත වර්ෂයේ වැටුප් හා වේතන රු.3,057,114,089 කින් හා අතිකාල හා නිවාඩු දින වැටුප් රු.493,149,099 කින් වැඩිවීම සමාලෝචිත වර්ෂයේ ඌණතාවයට හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 රජයේ ප්‍රදාන

| මූලාශ්‍රය | අනුමත මුදල | වැයකළ මුදල | ඌන උපයෝජනය | ඌන උපයෝජනය අනුමත මුදලේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | (රු.මිලියන) | (රු.මිලියන) | (රු.මිලියන) | % |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන(PSDG) | 2,233 | 1,040 | 1,193 | 53 |
| උපමාන පාදක ප්‍රදාන (CBG) | 935 | 481 | 454 | 49 |
| දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන සැලැස්ම(HSDP) | 234 | 157 | 77 | 33 |
| එකතුව | 3,402 | 1,678 | 1,724 | 51 |

ඉහත විග්‍රහ කර ඇති පරිදි පළාත් සංවර්ධන කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා අනුමත ප්‍රදානවලින් ඉතා ඉහළ ප්‍රතිශතයක් උපයෝජනය වී නොතිබුණි.

### 4.1.2 පළාත් සංවර්ධන සැලැස්ම

පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ යෝජනා 1815 ක් වෙනුවෙන් අනුමත කල ඇස්තමේන්තු මුදල සහ එම වැඩ යෝජනාවල ප්‍රගතිය පහත පරිදි විය.

| විස්තරය | නව වැඩ යෝජනා ගණන | අවිච්ඡේද වැඩ යෝජනා ගණන | මුළු වැඩ යෝජනා ගණන | මුළු වැඩවල ඇස්තමේන්තු වටිනාකම |
|---|---|---|---|---|
| | | | | (රු.මිලියන) |
| සම්පූර්ණයෙන් නිමකළ | 1242 | 111 | 1353 | 1,333.48 |
| 50 % කට වඩා වැඩියෙන් නිමකළ | 160 | 4 | 164 | 538.13 |
| 50 % කට වඩා අඩුවෙන් නිමකළ | 252 | 4 | 256 | 437.23 |
| ආරම්භ කර නොතිබූ | 40 | 2 | 42 | 53.63 |
| | 1694 | 121 | 1815 | 2362.47 |

උක්ත විග්‍රහයට අනුව වසර තුල නිම කිරීමට සැලසුම් කල වැඩ යෝජනාවලදි සියයට 16 කට ආසන්න ප්‍රමාණයක ප්‍රගතිය ඉතාමත් පහල මට්ටමක පැවැතුනි.

4.2 විධිමත් අධිකාරී බලයක් නොමැති ගනුදෙනු
-----------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දකුණු පළාත් සංවර්ධන අධිකාරිය සම්බන්ධව පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) 2018 වර්ෂයේ වෙන්කරන ලද ප්‍රතිපාදන වලට අදාළව ව්‍යාපෘති විෂයයන් ක්‍රියාත්මක කිරීමට විධිමත් නිර්ණායකයන් හා මාර්ගෝපදේශයන් සකස් කර නොතිබුණු අතර අවම වශයෙන් අංක 2016/01(1) දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛයේ විධිවිධානයන්ට හෝ අනුකූල නොවී එකතුව රු.87,238,285 ක් වූ වැඩ යෝජනා 31 ක් ක්‍රියාත්මක කර තිබුණි. තවත් වැඩ යෝජනා 11 ක් සඳහා එකතුව රු.42,400,000 ක් වූ ප්‍රතිපාදන හා අක් මුදල් 2018 දෙසැම්බර් 31 දින නිදහස් කර තිබූ නමුත් ඊට අදාළ ව්‍යාපෘති යෝජනා සඳහා 2019 ජූලි 31 දින වන විටත් ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලැබී නොතිබියදී අධිකාරිය විසින් එකතුව රු.15,403,835 ක් වූ වියදම් දරා තිබුණි. | ව්‍යාපෘති සඳහා විධිමත් නිර්ණායක හා මාර්ගෝපදේශවලට අනුකූලව සහ චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | අනුමත වැඩ යෝජනා අනුමත ප්‍රතිපාදන සීමාව තුළ ඉටු කර ඇත. |
| (ii) මූලධන වියදම් විධිමත් කිරීම සම්බන්ධයෙන් වූ ප්‍රධාන ලේකම්ගේ අංක 03/2015 දරන හා 2015 ජුනි 26 දිනැති චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල නොවී දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අධිකාරියට නිදහස් කළ මුදලින් එකතුව රු.136,237,163 ක් නොපියවා අධිකාරියේ බැංකු ගිණුම්වල අධිකාරි බලයක් නොමැතිව රඳවාගෙන තිබුණි. පළාත් මූල්‍ය රීති 268.2.1 ට අනුකූල නොවී එම බැංකු ගිණුම ආරම්භ කර තිබූ අතර 1995 අංක 01 දරන දකුණු පළාත් සංවර්ධන අධිකාරි ප්‍රඥප්තියේ 25(2) වගන්තියට අනුකූල නොවී එම ගිණුමේ තැන්පතු වලින් ඉපයූ එකතුව රු.9,950,045 ක් වූ පොලී ආදායම් අධිකාරිය | ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛ, පළාත් මූල්‍ය රීති හා දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ ප්‍රඥප්තිය අනුව කටයුතු කළ යුතුය. | ආදායම් මාරු කිරීම සම්බන්ධයෙන් ආදායම් ශීර්ෂ හඳුන්වාදීමක් සිදුකර නොමැත. උපදෙස් ඉල්ලා විමසීම් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | විසින් විවිධ ණය පහසුකම් ලබාදීමේ වැඩසටහන් සඳහා විධිමත් අනුමැතියෙන් තොරව භාවිතා කර තිබුණි. | | |
| (iii) | මුදල් කොමිෂන් සභාවේ අංක FC/3/3/2014 හා 2014 දෙසැම්බර් 31 දිනැති චක්‍රලේඛයට අනුකූල නොවී සහ 2016, 2017 හා 2018 වර්ෂ සඳහා පරිපාලන වියදම් දැරීමට ප්‍රධාන ලේකම් විසින් එකතුව රු.6,661,619 ක් ලබාදී තිබියදී අධිකාරියට ලැබුණු රු.38,000,000ක ප්‍රාග්ධන මුදලින් රු.3,420,000 ක් පරිපාලන වියදම් වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. | මුදල් කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. | පරිපාලන වියදම් අත්තිකාරම් ලැබුණු පසු එම මුදල් නැවත ව්‍යාපෘති ගිණුමට අයිභාර කර ක්‍රියාත්මක කිරීමේ පදනමින් දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත අග්‍රිම මාරුකර ඇත. |
| (ආ) | 2019 වර්ෂය තුළදී ජාතික පාසැල් ඉදිකිරීම් අධීක්ෂණය සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සහ ගණකාධිකාරී යන නිලධාරීන් තිදෙනෙකු වෙනුවෙන් මාස 11 ක් සඳහා රේඛීය අමාත්‍යාංශ වැය ශීර්ෂය මගින් එම ඉදිකිරීම් අධීක්ෂණයන් සම්බන්ධයෙන් කිසිඳු වාර්තාවක් ඉදිරිපත් කර නොතිබියදී රු.571,458 ක් ගෙවා තිබුණි. | ඉදිකිරීම් අධික්ෂණය කිරීම සම්බන්ධයෙන් වාර්තා ඉදිරිපත් කළ යුතුය. | දකුණු පළාතේ පාසල්, විද්‍යාපීය ගුරු පුහුණු මධ්‍යස්ථානවල ඉදිකිරීම් හා අළුත්වැඩියා කටයුතු 2015 ට පෙර සිටම ගිණුම් අංශයේ විෂය පථයට ඇතුලත් වී තිබුණි. වෙනත් පළාත්වල මෙම කාර්යය ඉටු කරනු ලබන්නේ දෙපාර්තමේන්තුවට අනුයුක්ත ඉංජිනේරුවරයෙකු යටතේ වෙනම කාර්ය මණ්ඩලයක් විසින්ය. අමාත්‍යාංශ අනුමැතිය මත සති අන්ත දින 04 ක් අධීක්ෂණය සිදු කරන ලද්දේ තාක්ෂණික ගැටළු නොව භෞතිකව සිදුවන අළුත්වැඩියා හා ඉදිකිරීම් පමණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත බඳවා ගන්නා ලද දීපව්‍යාප්ත සේවාවල විධායක නිලධාරීන් දකුණු පළාත් සභාවට අනුයුක්ත කිරීමෙන් පසු ආණ්ඩුකාර ලේකම්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්, සභා ලේකම් සහ පළාත් අමාත්‍යාංශ ලේකම් යන තනතුරුවලට පත්කිරීම ආණ්ඩුකාරවරයා විසින් සිදුකර තිබුණි. එහිදී විශේෂ ශ්‍රේණිවලට උසස් කිරීම සඳහා එම සේවාවන්ට අදාළ සේවා ව්‍යවස්ථාවල අවශ්‍යතා සම්පූර්ණ කර නොතිබියදී හා පත්වීම් බලධාරියාගේ නිර්දේශ රහිතව ආණ්ඩුකාරවරයා විසින් උසස්වීම් ලබාදී තිබුණි. තවද එම තනතතුරුවලට අදාළ වැටුප් තලයන්ට සමාන්තරව ලබාදෙනු ලබන අනෙකුත් දීමනා හා වරප්‍රසාද ලබාදී තිබූ බව නිරීක්ෂණය විය. | සේවා ව්‍යවස්ථාවන්ට අනුකූලව උසස්වීම් ලබාදිය යුතුය. | ගරු ආණ්ඩුකාරතුමා විසින් එතුමාගේ බල සීමාවේ සිට මහජන සේවය අඛණ්ඩව පවත්වා ගැනීම උදෙසා නිලධාරීන් අදාළ තනතුරුවලට වැඩබැලීමට පත්කර ඇත. |

## 4.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | | | |
|---|---|---|---|
| (අ) | තාසිම් ළය චිකිත්සාගාරයේ 2012 ජනවාරි 13 දින සවිකරන ලද ඇඟිළි සළකුණු යන්ත්‍රය මාස 06 ක් ගත වීමට පෙර ජුනි මස අක්‍රීය වී තිබුණි. එදින සිට 2019 ජුනි මස දක්වාම ඇඟිළි සළකුණු යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණු අතර එම යන්ත්‍රය අළුත්වැඩියා කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩල පැමිණීම හා පිටවීම සනාථ කිරීමට ස්ථාපිත කළ ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළයුතුය. | නව ඇඟිළි සලකුණු යන්ත්‍රයක් ස්ථාපිත කර ඇත. |
| (ආ) | හම්බන්තොට දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ 2019 ජනවාරි 01 දිනට පැවති ලිපිද්‍රව්‍ය තොගය රු.407,180 ක්ද වර්ෂය තුළ මිලට ගැනීම් රු.7,640,145 ක්ද සහ සමාලෝචිත වර්ෂයේ පරිභෝජනය රු.1,585,307 ක්ද වූයෙන් 2019 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොගය රු.6,462,018 ක් විය. මේ අනුව වාර්ෂික පරිභෝජන අවශ්‍යතාවන් සැලකිල්ලට නොගෙන ලිපිද්‍රව්‍ය තොග මිලදී ගෙන තිබුණි. | ලිපිද්‍රව්‍ය තොග නිවැරදිව වර්ගීකරණය කළයුතුය. | ලිපිද්‍රව්‍ය තොග වර්ගීකරණ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.1,415,557,677 ක් වූ අතර, එම ශේෂය තුළ නිලධාරීන් 427 දෙනෙකුගෙන් තවදුරටත් අයවිය යුතු එකතුව රු.24,165,058 ක් වූ ණය ශේෂ ඇතුළත්ව තිබුණි. තවද දකුණු පළාත් සභාවේ ආයතන මෙන්ම, වෙනත් පළාත් සභා හා මධ්‍යම රජයේ ආයතන වලින් ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් 115 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු රු.6,205,632 ක් වූ ණය ශේෂද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. | ඇතැම් ණය ශේෂ ඉතා පැරණි ශේෂ වන අතර ඒවා හඳුනා ගැනීමට අපහසු වේ. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඈ) මහානගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 317 වගන්තිය ප්‍රකාර දකුණු පළාතේ මහා නගර සභාවන්හි කටයුතු සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්වරයා විසින් පිළියෙල කර මහානගර සභාවට ඉදිරිපත් කළයුතු වාර්ෂික වාර්තා 2018 හා 2019 වර්ෂ සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මහානගර සභා ආඥා පනතේ 317 වගන්තිය අනුව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී යථා පරිදි කටයුතු කරමි. |

## 4.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගාල්ල දිස්ත්‍රික් ඖෂධ ගබඩාවේ 2019 වර්ෂයේ ගබඩා පරීක්ෂණ වාර්තාව අනුව අපහරණය කළ යුතු බවට හඳුනාගන්නා ලද වටිනාකම රු.17,755,890 ක් වූ ඖෂධ වර්ග 154 ක් 2019 නොවැම්බර් 29 දින දක්වා අපහරණය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගබඩා පරීක්ෂණ වාර්තා අනුව ඖෂධ අපහරණය සඳහා ක්‍රියාමාර්ග ගතයුතුය. | කඩිනමින් අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමි. |

**4.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2019 වර්ෂයේ ග්‍රාම නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහනේ මූලධන වියදම් යටතේ ලිපිද්‍රව්‍ය දීමනා වශයෙන් දකුණු පළාතේ ග්‍රාම නිලධාරීන් සඳහා 2019 මැයි 24 දින අනුමත දීමනාවට අමතරව තවත් රු.1,500 ක් බැගින් ගෙවීම් කිරීම හේතුවෙන් ග්‍රාම නිලධාරීන් 2095 ක් සඳහා රු.3,142,500 ක මුදලක් අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. ඊට අමතරව අදාළ චෙක්පත ලබා දීමේ උත්සව 02 ක් පවත්වා තිබූ අතර ඒ සඳහා රු.1,259,163 ක්ද වැයකර තිබුණි. | අනුමත නොවන අමතර දීමනා ගෙවීමේදී අනුමැතිය ලබාගෙන ගෙවීම් කළ යුතුය. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව ගෙවීම් කරන ලද නමුත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන නොමැති බව පිළිගනිමි. ඉදිරියේදී අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ආ) | රුහුණු සංචාරක කාර්යාංශය විසින් රු.46,042,006 ක් වැය කර රජයේ ඉඩමක ඉදිකර තිබූ හික්කඩුව අභිමංසල ගොඩනැගිල්ල ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය නොකර තෙවන පාර්ශවයකට පැවරීම හා වර්තමානයේ ප්‍රයෝජනයට නොගෙන වසා දමා තිබෙන අතර 2019 වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු.6,800,000 ක බදු මුදල් ලැබී නොතිබුණි. | විධිමත් පරිදි තෙවන පාර්ශවයකට පැවරිය යුතුය. | සන්තකය ආපසු පවරා ගැනීම සඳහා නඩු පවරන ලෙස හික්කඩුව ප්‍රාදේශීය ලේකම් වෙත ලිඛිතව දන්වා ඇත. |
| (ඇ) | මැතිවරණ කොමිෂන් සභාවේ 2019 සැප්තැම්බර් 18 දිනැති අංක 01 දරන EC/EDR/PRE -2019 චක්‍රලේඛය හා 2019 ජූනි 17 දිනැති අයවැය චක්‍රලේඛ අංක 4/2019 ට අනුකූල නොවන ලෙස දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් රු.500,000 ක් වැයකර මාධ්‍යවේදීන් 30 දෙනෙකු සඳහා ජංගම දුරකථන බෙදා දී තිබුණි. | මැතිවරණ කොමිෂන් සභාවේ චක්‍රලේඛය අනුව කටයුතු කල යුතුය. | චක්‍රලේඛවලට අනුකූලව සංශෝධිත වැඩ යෝජනා අනුව සිදුකරන ලදි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ 2019 සංවර්ධන සැලැස්ම යටතේ ස්වේච්ඡා සංවිධාන සඳහා ප්ලාස්ටික් පුටු 16056 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.15,880,200 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1 සහ 4.4 යන මාර්ගෝපදේශවලට අනුකූල නොවී දකුණු පළාතේ දිස්ත්‍රික්ක 03 සඳහා වෙන වෙනම කොටස් කර ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණු අතර, ප්‍රධාන ලේකම්ගේ අංක 3/2016 දරන හා 2016 අගෝස්තු 24 දිනැති චක්‍රලේඛයට අනුකූල නොවී භාණ්ඩ සඳහා වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමය යටතේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමත සීමාව ඉක්මවා, ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන 16.5 ක් වූ මෙම ප්‍රසම්පාදනය සිදුකර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට හා චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව නිවැරදිව කටයුතු කිරීමට පියවර ගනිමි. |
| (ii) | ප්ලාස්ටික් පුටු මිලදී ගැනීම සඳහා වෙළෙඳපොල මිල සැදැහුම් ක්‍රමය යටතේ සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමේදී නිශ්චිත පිරිවිතරයන් සඳහන් නොකර, ප්ලාස්ටික් පුටු නිෂ්පාදිත ආයතනයකින් හා ප්ලාස්ටික් පුටු අලෙවි කරන වෙලෙඳසැල් වෙතින් මිල ගණන් කැඳවා තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන කමිටුවට ලැබුණු අවම මිල ගණන් පිළිබඳව නොසලකා වැඩි මිලට පුටු මිලදී ගැනීම වෙනුවෙන් රු.2,819,085ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි. | නිශ්චිත පිරිවිතරයන් සඳහන් කර මිල ගණන් කැඳවිය යුතුය. | දිස්ත්‍රික්කය තුළ නොමිලේ ප්‍රවාහනය කර දීම යන කරුණු සැලකිල්ලට ගෙන ප්‍රසම්පාදන කමිටුව විසින් ආයතන තෝරා ගන්නා ලදි. |
| (iii) | සෘජුවම නිෂ්පාදන ආයතනවලින් මිල ගණන් කැඳවීම් නොකර, එක් නිෂ්පාදන ආයතනයක මිල ගණන් සමඟ තොග හා සිල්ලර සැපයුම්කරුවන්ගේ මිල ගණන් සැසඳීමෙන් පුටු මිලදී ගැනීමට ප්‍රසම්පාදන තීරණ ගැනීම හේතුවෙන් රු.4,300,988 ක පාඩුවක් රජයට සිදුකර තිබුණි. | රජයට සිදු වූ පාඩුව වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතුය. | මූලික විමර්ෂණයෙන් පසුව ඉදිරි ක්‍රියාමාර්ග සඳහා යොමු වෙමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ මාණ්ඩලික නිලධාරීන්ගේ නිල වාහන දීමනා හා ඉන්ධන දීමනා පිළිබඳව පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | භාණ්ඩාගාර ලේකම්ගේ අංක PED 1/2015 දරන හා 2015 මැයි 25 දිනැති චක්‍රලේඛයේ 3.1 හා 3.2 ඡේදයන්ට අනුකූල නොවී අධිකාරියේ සභාපතිවරයා විසින් පාවිච්චි කළ නිල වාහනය සඳහා 2016 ජනවාරි සිට 2019 ජුනි දක්වා මසකට අනුමත ඉන්ධන සීමාව ඉක්මවා එකතුව රු.1,999,984 ක් වූ ඉන්ධන ලීටර් 17092 ක් හා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පාවිච්චි කළ නිල වාහනය සඳහා 2016 ජනවාරි සිට 2018 සැප්තැම්බර් දක්වා මසකට අනුමත ඉන්ධන සීමාව ඉක්මවා එකතුව රු.714,672 ක් වූ ඉන්ධන ලීටර් 7256 ක් ඉන්ධන ඇණවුම් මඟින් ලබා ගෙන තිබුණි. | 2015 මැයි 25 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ අංක PED 1/2015 දරන චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | රජයට අයවිය යුතු රු.1,999,984 ක මුදල අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ii) | යථෝක්ත චක්‍රලේඛයේ 3.3 ඡේදයට අනුකූල නොවී අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට 2018 ඔක්තෝබර් සිට 2019 ජුනි දක්වා ප්‍රවාහන දීමනාව හා ඉන්ධන දීමනාව වශයෙන් එකතුව රු.750,000 ක් ගෙවා තිබියදී අධිකාරියේ සංචිත වාහනයක්ද පාවිච්චි කර තිබුණි. තවද ඉන්ධන දීමනාවට හා ප්‍රවාහන දීමනාවට අමතරව රියදුරු වැටුප් හා දීමනා සඳහා එකතුව රු.619,826 ක් සහ ඉන්ධන සඳහා රු.400,199 ක් අධිකාරිය විසින් අමතරව වැය කර තිබුණි. | 2015 මැයි 25 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ අංක PED 1/2015 දරන චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | වර්තමානයේ චක්‍රලේඛය අනුව කටයුතු කරන බවත්, උපරිම සීමාව ඉක්මවන අවස්ථාවන්හිදී අමාත්‍යාංශ ලේකම් මඟින් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. අයකල යුතු මුදල අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ඊ) | වාහන අළුත්වැඩියාවක් සම්බන්ධව මහජන පෙත්සම් කාරක සභාවට ලැබුණු පෙත්සමක් පරීක්ෂාව සඳහා පත් කරන ලද කමිටුව විසින් අළුත්වැඩියාව සඳහා චක්‍රලේඛ, නීතිරීති, රෙගුලාසි හා ටෙන්ඩර් ක්‍රියාපටිපාටි අනුගමනය කිරීමක් දක්නට නොලැබෙන බැවින් අළුත්වැඩියාව සම්බන්ධ නිශ්චිත තහවුරු | නීති, රීති රෙගුලාසිවලට අනුකූලව අළුත්වැඩියා සිදුකල යුතුය. | ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන අදාළ ගෙවීම සිදුකර ඇත. |

කිරීමක් කළ නොහැකි බව නිගමනය කර තිබීම සහ අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් අළුත්වැඩියාවන්ට වැය වන මුදල රු.285,000 ක් ලෙස පෙන්වාදී තිබියදී ඊට අදාළව යොමු වූ අභියාචනාවක් පිළිගෙන ආණ්ඩුකාරවරයා කල අනුමැතිය පරිදි රු.1,285,000 ක මුදලක් ගෙවා තිබුණි.

4.6 දෘශ්‍ය අක්‍රමිකතා

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් ඌන උපයෝජිත අරමුදල් භාවිතා කරමින් ව්‍යවසායකත්ව දිරිබල සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ 2019 වර්ෂයේදී බාහිර පුද්ගලයින් දෙදෙනෙකුට Speed Draft ණය ලෙස එකතුව රු.5,000,000 ක් ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ. | | | |
| (අ) | මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන ලේකම්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) හෝ ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබී නොතිබුණු අතර ණයකරුවන්ගෙන් ඇප සුරැකුම් ලබා නොගෙන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පෞද්ගලික ඉඩම ඇප සුරැකුම් ලෙස තබාගෙන ණය මුදල් නිදහස් කර තිබුණි. | නිසි අනුමැතිය හා ඇප සුරැකුම් ලබාගෙන ණය ලබාදිය යුතුය. | මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා නොදුන් අතර සිදුව ඇති අක්‍රමිකතාවය පිළිබඳ මූලික පරීක්ෂණයක් සිදුකරමින් පවතී. |
| (ආ) | පළාත් මූල්‍ය රීති 83 ප්‍රකාරව නිකුත් කළ ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ මූල්‍ය බලතල චක්‍රලේඛයට අනුකූල නොවී ණය මුදල් ගෙවීමට අදාල වවුචර්පත් අනුමත කිරීම, සහතික කිරීම හා ගෙවීම යන සියළු කටයුතු අධිකාරියේ අධ්‍යක්ෂ | පළාත් මූල්‍ය රීති 83 අනුව නිකුත් කල මූල්‍ය බලතල චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. | මූලික පරීක්ෂණ වාර්තාව පදනම් කරගෙන ඉදිරි ක්‍රියාමාර්ගවලට යොමු වෙමි. |

ජනරාල්වරයා විසින්ම සිදුකර තිබුණු අතර, ණයකරුවන් නමින් නිකුත් කරන ලද එකතුව රු.5,000,000 ක් වූ චෙක්පත් දෙකෙහිම රේඛනයන් අවලංගු කර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්ම බැංකු කවුන්ටරයෙන් මුදල් ලබාගෙන තිබුණි. එසේම ණයලාභීයෙකුගේ රු.1,557,610ක් වූ ණය වාරිකයන් අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගෙවා තිබුණු අතර, ඉදිරියේදී ගෙවිය යුතු ණය වාරික සඳහා අධ්‍යක්ෂ ජනරාල්ගේ පෞද්ගලික ජංගම ගිණුමට අදාළව වටිනාකම හා දිනය සඳහන් නොවූ හිස් චෙක්පත් 06 ක් භාරදී තිබුණි.

4.7 හඳුනාගන්නා ලද පාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා කාර්යාලවලට අයත් නොවිසඳී පවතින අවස්ථා 39 කට අදාළ රු.8,251,133 ක වාහන අනතුරු සම්බන්ධ හානි, අවස්ථා 14 කට අදාළ රු.1,153,277 ක දේපල හානි හා රු.1,837,094 ක මුදල් වංචාවක් ඇතුළු මුළු හානිවල එකතුව රු.11,241,504 ක් විය. | හානි හා පාඩුවලට අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | අවස්ථා 36 කට අදාළව රු.7,705,819ක වාහන අනතුරු, අවස්ථා 12 කට අදාළ රු.774,457ක දේපල හානි හා රු.1,837,094 ක මුදල් වංචාව තවදුරටත් අයකර ගැනීමට ඇත. |
| (ආ) | පරිවාස දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේදී රු.2,725,300 ක් වැය කරමින් මෙට්ට 744 ක් මිලදී ගෙන තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිදභාවයකින් සිදු නොකිරීම නිසා ආයතනයට රු.251,500 ක පාඩුවක් සිදු වී තිබුණි. මෙම මෙට්ට දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන අතර විධිමත්ව බෙදා දී තිබූ බවට ලිඛිත සාක්ෂි නොතිබුණු අතර බෙදා දී තිබූ මෙට්ට විශාල ප්‍රමාණයක් ළමා නිවාසවල භාවිතයෙන් තොරව ගබඩා කර තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිදභාවයෙන් යුක්ත විය යුතු අතර මිලදී ගත් ද්‍රව්‍ය නිසි පරිදි උපයෝජනය කල යුතුය. | මෙට්ට මිලදී ගැනීමට පෙර ළමා නිවාසයෙහි අවශ්‍යතා විමසීම් කර විනිවිදභාවයකින් යුතුව ප්‍රසම්පාදන කටයුතු සිදුකලෙමි. |

4.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඇස්තමේන්තු වටිනාකම රු.3,746,000 ක් වූ හල්පාතොට නිවර්තන නිවාසයේ ගල් බැම්ම සහ තාප්පය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සුදුසුකම් පරීක්ෂාවකින් තොරව අදාළ මූල්‍ය සීමාව ඉක්මවා ග්‍රාම සංවර්ධන සමිතියකට පිරිනමා තිබුණු අතර ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් එකතුව රු.987,568 ක් වැඩිපුර ගෙවා තිබුණි. | මේ පිළිබඳ විමර්ශනයක් කර වැඩිපුර ගෙවා ඇති මුදල ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | වැඩිපුර මුදලක් ගෙවා නොමැති බව තාක්ෂණ නිලධාරී වාර්තාවේ සඳහන් වේ. කෙසේ වුවද හානිය පිළිබඳව තාක්ෂණික විශේෂඥ වාර්තාවක් ලබා ගැනීම සඳහා කටයුතු කර ඇත. |
| (ආ) | මහමෝදර රුහුණු රන්සළු ආයතනයට නව සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.8,398,478 ක වටිනාකමකට කොන්ත්‍රාත් ආයතනයක් සමඟ 2018 නොවැම්බර් 05 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා කාලයකට ගිවිසුම්ගතවී 2019 වර්ෂයේ රු.7,209,100 ක් ගෙවා තිබුණි. එම මුදල තුළ සැලසුම් වෙනස්වීම නොසලකා හැරීම නිසා රු.259,974 ක් හා වැඩ විෂයයන් 02 ක් සඳහා රු.593,244 ක් වශයෙන් රු.853,218 ක් වැඩිපුර ගෙවා තිබුණි. | මේ පිළිබඳ විමර්ශනයක් කර වැඩිපුර ගෙවා ඇති මුදල ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ගිවිසුම්ගත මිල අනුව ගෙවීම නිසා වැඩිපුර ගෙවීමක් සිදුවී නැත. |
| (ඇ) | බලපිටිය මූලික රෝහලේ වෛද්‍ය නිල නිවාස සංකීර්ණය ඉදිකිරීම් නිමකර අවුරුද්දකට අඩු කාලයක් තුළ ගොඩනැගිල්ල සඳහා භාවිතාකර තිබුණු ඇලුමිනියම් පවුඩර් කෝටඩ් (Aluminium Powder Coated) ජනෙල් පියන්වල හා බාර්වල පවුඩර් කෝටින් (Coating) ගැලවී ගොස් තිබුණි. ඒ සඳහා ගෙවා තිබුණු රු.7,010,091 ක් නිසි ප්‍රමිතියෙන් තොර ඉදිකිරීම් සඳහා සිදුකර තිබුණි. | නිසි ප්‍රමිතියෙන් ඉදිකිරීම් සිදුකරගත යුතුය. | කොන්ත්‍රාත්කරු විසින් අඩුපාඩු සකස් නොකළහොත් ගෙවීමට ඇති රඳවුම් මුදලින් වෙනත් කොන්ත්‍රාත්කරුවකු ලවා එම අඩුපාඩු සකස් කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | පොල්වත්ත ආයුර්වේද රෝහලේ සිව්මහල් වාට්ටු සංකීර්ණය ඉදිකිරීමේ කර්මාන්තය සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | සැලසුම්, ව්‍යුහාත්මක සැලසුම් හා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් නොකර රු.මිලියන 10 ට අඩු ඉංජිනේරු ඇස්තමේන්තු මඟින් අදියර 5 ක්, ඉදිකිරීම් සංවර්ධන ආයතනයේ - C7 ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවෙකුට තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව පැවරීම නිසා C 1,2 හෝ 3 වැනි සුදුසුකම් සහිත කොන්ත්‍රාත්කරුවෙකු ලවා වඩා වාසිදායක හා කාර්යක්ෂමතාවකින් යුක්තව ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | රජයට වඩා වාසිදායක පරිදි කර්මාන්ත ඉටුකරගත යුතුය. | සංවර්ධන සැලැස්මෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන මත ඇස්තමේන්තු සකස්කර අත. |
| (ii) | ප්‍රමිතයෙන් බැහැර කොන්ක්‍රීට් හා කම්බි වැඩ වෙනුවෙන් රු.32,427,838 ක් ගෙවා තිබුණි. | ප්‍රමිතයෙන් යුතු ද්‍රව්‍ය භාවිතා කළයුතුය. | කොන්ක්‍රීට් වැඩ, කම්බි වැඩ හා හැඩයන් වැඩ දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලීය තාක්ෂණ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ප්‍රමිතියට අනුව සිදුකර ඇත. |
| (iii) | අසාමාන්‍ය ප්‍රමාදය වෙනුවෙන් රු.1,566,633 ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. | ඉදිරිපත් කර තිබුණු හේතු පිළිගත නොහැකි බැවින් ප්‍රමාද ගාස්තු අයකල යුතුය. | කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද හේතු සාධාරණද යන්න සලකා බලා කාලය දීර්ඝ කර ඇත. |
| (iv) | සියයට 30 ක අත්තිකාරම් මුදල පළමු අදියර 4දී ක්‍රමිකව අය නොකර රු.6,083,029 ක් දීර්ඝ කාලයක් තුළ, කොන්ත්‍රාත්කරු ළඟ රඳවා තැබීම මඟින් කොන්ත්‍රාත්කරුට වාසිදායක ලෙස කටයුතු කර තිබුණි. | අත්තිකාරම් නිවැරදිව අනුපාතිකව අයකල යුතුය. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (v) | කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබූ ප්‍රමාණ පත්‍ර මකන දියර භාවිතයෙන් මකා වෙනස්කර තිබූ අතර අනුපිටපතද විවෘත කර තිබුණු අතර තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන මණ්ඩලය ඊට අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කල යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ඉ) | යශෝරාපුර සදර්ශ ගම්මානය සඳහා තොරතුරු මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් රු.26,924,982 ක මුදලකට 2016 දෙසැම්බර් 31 දින වන විට කර්මාන්තයේ වැඩ නිම කිරීමට 2016 දෙසැම්බර් 23 දින පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙක් සමඟ ගිවිස ගෙන තිබුණි. මහල් 02 කින් යුත් ගොඩනැගිල්ල ප්‍රායෝගිකව ඉටු කළ නොහැකි දින 8 කින් නිම කිරීමට ගිවිසුම් ගත වී තිබූ අතර කර්මාන්තයේ වැඩ නිම කිරීම 2019 වර්ෂය අවසාන වන විටද සිදුව නොතිබුණි. කාර්ය සාධන බැඳුම්කරයේ කාලය දීර්ඝ නොකර කර්මාන්තයේ කාලය දින 842 කින් දීර්ඝ කර තිබුණි. ලැමිනේට් ටෙම්පර්ඩ් වීදුරු සවි කිරීම වැඩ විෂයය සඳහා ව්‍යාජ ලෙස රු.7,144,677 ක්, කර්මාන්තයේ කාලය දීර්ඝ කිරීම නිසා මිල ගණන් වෙනස් වීම මත රු.732,664 ක් හා අමතර වැඩ යටතේ රු.357,566 ක් ලෙස එකතුව රු.8,234,907 ක් ගෙවා තිබුණි. | කර්මාන්තයේ කාලය දීර්ඝ කිරීම සමඟ කාර්යසාධන බැඳුම්කරයේ කාලය දීර්ඝ කල යුතු අතර නිසි ප්‍රමිතියෙන් හා ගිවිසුම්ගත වටිනාකම් අනුව ඉදිකිරීම් ඉටුකර ගතයුතුය. වැඩිපුර ගෙවන ලද මුදල් ආපසු අයකර ගත යුතුය. | ටෙම්පර්ඩ් වීදුරු සඳහා වැඩිපුර ගෙවන ලද මුදල නැවත අයකිරීමට කටයුතු කරමින් පවතී. |
| (ඊ) | දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් හුංගම ගොවිපළ භූමියේ භෞතික ප්‍රාග්ධන වත්කම් ගොඩනැගීම හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.3,389,406 ක් වැයකර තිබුණි. මෙහිදී ව්‍යාපෘතියට භාවිතා නොකළ ගොඩනැගිලි ද්‍රව්‍ය හා අනෙකුත් භාණ්ඩ සඳහා රු.1,138,680 ක් සැපයුම්කරු විසින් සපයා නොතිබුණු භාණ්ඩ හා සේවා සඳහා රු.332,050 ක් | වැඩියෙන් ගෙවන ලද මුදල් ආපසු අයකරගත යුතුය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) මඟින් මූලික පරීක්ෂණයන් සඳහා යොමුකර ඇති අතර එහි නිර්දේශ මත ඉදිරි කටයුතු සඳහා යොමුවෙමි. |

සහ පුහුණු හා නුපුහුණු ශ්‍රමයට අනුමත වැටුප් රේටයන් ඉක්මවා හා වැඩකළ සත්‍ය දින ගණන ඉක්මවා රු.443,750ක්, වශයෙන් එකතුව රු.1,914,480 ක් අවිධිමත් ලෙස වැඩියෙන් ගෙවා තිබුණි.

## 4.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

### 4.9.1 අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2019 වාර්ෂික සැලසුමෙන් පරිබාහිරව වෙනත් අත්‍යාවශ්‍ය කාර්යයන් සඳහා වෙන් කරන ලද මුදල් උපයෝගී කර ගනිමින් ජය සංඛ හා සිසුතරණ ව්‍යාපෘති පිළිබඳ දත්තයන් ඇතුළත් අත් පත්‍රිකා 535,000 ක් මුද්‍රණය කර පළාත් පාසැල් සිසුන් හා ගුරුවරුන් අතරේ බෙදාහැරීම සඳහා රු.3,353,212 ක මුදලක් වැය කර තිබුණි. මෙහිදී අත්පත්‍රිකා මුද්‍රණය කර බෙදා හැරීමේ කාර්යයෙහි අරමුණ විගණනයට පැහැදිලි නොවීය. | අරමුණුගත කාර්යයෙන් බැහැරව කටයුතු නොකල යුතුය. | 5 වසර, අ.පො.ස. සාමාන්‍ය පෙළ, උසස් පෙළ විභාගයන්හි අඛණ්ඩ ප්‍රගතිය පිළිබඳව දැනුවත් කිරීම තුලින් ආකල්ප සංවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලදි. |

### 4.9.2 අපේක්ෂිත ප්‍රතිලාභ (out Come)ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මදුනාගල ස්වභාවික උණුදිය උල්පත් ආශ්‍රිතව සංචාරක පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් රුහුණු සංචාරක කාර්යාංශය විසින් රු. මිලියන 46 ක් වටිනා භෝජනාගාරයක් 2017 වර්ෂයේ සිට ඉදිකෙරෙමින් තිබූ නමුත්, මෙම ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබීම හේතුවෙන් මහජනයාට ඉන් ප්‍රයෝජන ගත හැකිව නොතිබුණි. | ඉදිකිරීම් කටයුතු කාර්යක්ෂමව කරගත යුතුය. | 2020 වසර අග පමණ වන විට මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට කාර්යාංශය අපේක්ෂා කරනු ලැබේ. |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (ආ) | සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.8.4 ට අනුකූල නොවී රු.3,786,375 ක් ගෙවා අඩු ගුණාත්මකභාවයෙන් හා කල් පැවැත්මෙන් තොර වානේ කබඩ් 375ක් මිලදී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 ඡේදයට අනුකූල විය යුතුය. | නිෂ්පාදනයේ ගුණත්වයන් සහ මිල ගණන් සලකා රාජ්‍ය විවිධ නීතිගත සංස්ථාවෙන් මිලදී ගන්නා ලදි. |
| (ඇ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද පළතුරු වගා සංවර්ධන සහ කාබනික එළවළු වගා සංවර්ධන ව්‍යාපෘති සඳහා රු.4,216,195 ක පැල මිලදී ගෙන බෙදා හැර තිබුණද ඉන් පැල සියයට 80 ක් පමණ විනාශ වී අපේක්ෂිත අරමුණු ඉටු කරගත නොහැකි වී තිබුණි. | ස්වභාවික හානිවලට පරිබාහිරව සිදුවන හානි අවම කර ගැනීමට කටයුතු කල යුතුය. | පැල වර්ගවලින් කොටසක් ස්වභාවික සත්ව හානි හා ගංවතුර හේතුවෙන් විනාශ වී ඇත. |

**4.10 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාහන අපහරණය | | |
| | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන 08 ක් භාවිතයෙන් තොරව ප්‍රාදේශීය ඖෂධ ගබඩා භූමියේ ගාල්කර තිබුණු අතර, ඉන් වාහන 06 ක් අපහරණය කිරීමට නිර්දේශ කර තිබුණි. එම වාහන වෙනත් ආයතනයකට ලබාදීමට හෝ රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2015 විධිවිධාන ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2015 අනුව කටයුතු කල යුතුය. | වාහන 06 න් 02 ක් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත යොමුකර ඇති අතර ඉතිරි වාහන 04 රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2015 අනුව ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. |
| (ආ) | නිශ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම් | | |
| | සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් රු.5,052,295 ක් වැයකර උපකරණ සවිකරන ලද ළමා උද්‍යාන වලින් හල්පාතොට නිවර්තන නිවාසයේ උපකරණ කට්ටලය සහ රුහුණු ළමා නිවාසයේ ස්ථාපිත කර ඇති සෙල්ලම් කලාපය භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | වත්කම් භාවිතා කිරීමට කටයුතු කල යුතුය. | උද්‍යාන කට්ටල භාවිතා කරනු ලැබේ. |

## 4.11 කාර්ය මණ්ඩල පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගාල්ල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සේවකයින් හය දෙනෙකු දීර්ඝ කාලිනව ප්‍රධාන අමාත්‍යාංශයට සහ ප්‍රධාන අමාත්‍ය කාර්යාලයට අනුයුක්ත කර තිබුණි. 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ සේවයට වාර්තාකිරීම ඇඟිළි සළකුණු යන්ත්‍ර මඟින් සනාථකර නොගෙන මෙම සේවකයන් වෙනුවෙන් දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා කාර්යාලයෙන් එකතුව රු.7,585,234 ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි. | සේවයට වාර්තා කිරීම සනාථ කරගෙන වැටුප් ගෙවිය යුතුය. | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් මත ප්‍රධාන අමාත්‍යාංශයට හා අමාත්‍ය කාර්ය මණ්ඩලයට අනුයුක්ත කර ඇත. වැටුප් ගෙවීම ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයේ වාර්ෂික ඇස්තමේන්තුවට ඇතුලත් කර ඇත. |
| (ආ) | ඉකුත් වර්ෂ 05 තුළ දකුණු පළාත් සභාවට අයත් රෝහල්වලට හා අනෙකුත් සෞඛ්‍ය ආයතනවලට ස්ථාන මාරුවීම් ලද ශ්‍රේණිගත වෛද්‍ය නිලධාරීන් 672 කින් 279 ක ස්ථාන මාරුවීම් හා දකුණු පළාත් සභාවට අයත් රෝහල් වලින් හා අනෙක් සෞඛ්‍ය ආයතන වලින් පිටතට ස්ථාන මාරුවීම් කළ ශ්‍රේණිගත වෛද්‍ය නිලධාරීන් 636 කින් 228 ක ස්ථාන මාරුවීම් 2019 ජුනි 30 දින වන විටත් ක්‍රියාත්මකවී නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී පළාත් සභාවට ස්ථාන මාරුවීම් ලද වෛද්‍ය නිලධාරීන් 111 දෙනෙකුගෙන් 100 ක් පැමිණ නොතිබුණ අතර, නිලධාරීන් 114 දෙනෙකුගෙන් 97 ක් පිටතට ගොස් නොතිබුණි. | ස්ථාන මාරුවීම් ක්‍රියාත්මකවීම පිළිබඳ පසුවිපරම් සිදුකල යුතුය. | අදහස් දක්වා නොමැත. |

## 4.12 ප්‍රසම්පාදනය

---------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂයේ 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනී සිටින දරුවන්ට ප්‍රශ්න පත්‍ර කට්ටලයක් 2019 මාර්තු 31 හා අප්‍රේල් 04 දින අතර කාලය තුළ බෙදා දී තිබුණි. නමුත් ප්‍රශ්න පත්‍ර මුද්‍රණය සඳහා 2019 සැප්තැම්බර් 20 දින දක්වාම මුද්‍රණ ඇණවුම සැපයුම්කරු වෙත ලබා දී නොතිබුණද, ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කර රු.1,462,000 ක් වටිනා දින රහිත බිල්පත්‍ර ඉදිරිපත් කර තිබුණි. | නියමිත දිනට සැපයුම්කරු වෙත මුද්‍රණ ඇණවුම් භාර දිය යුතුය. | මිල ගණන් කැඳවීමේ අක්‍රමිකතාවයක් පැවතුණ හෙයින් ප්‍රසම්පාදන මණ්ඩල සාමාජිකයින් විසින් ඊට අදාළ ප්‍රසම්පාදන තීරණය ලබාදීම සිදුකර නොමැති අතර ඒ අනුව මෙම කාර්යාලයට අදාළ මුද්‍රණ ඇණවුම කිසිදු ආයතනයක් වෙත අධිකාරිය විසින් ලබාදී නැති බවත් ප්‍රධාන අමාත්‍යාංශය වෙතින් හෝ කිසියම් මුද්‍රණ ආයතනයක් වෙතින් මෙම ප්‍රශ්න පත්‍ර කට්ටල මෙම කාර්යාලයට ලබාදී නොමැත. |
| (ආ) | පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිසු තරණ ගුරු උපහාර වැඩ සටහන යටතේ තිළිණයන් මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූල නොවී රු.8,566,600 ක මුදලකට ආකෘති වර්ග 2 කින් උපහාර තිළිණපත් 7969 ක් මිලදී ගෙන තිබුණි. මෙම මිලදී ගැනීමෙන් රු.2,569,980 ක මූල්‍ය පාඩුවක් සිදු වී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල විය යුතුය. | පළාත් සභා විසුරුවා හැරීමට ප්‍රථම මෙම උපහාර උළෙල පැවැත්වීමට තීරණය කරන ලද අතර කෙටි කාලයක් තුළ අදාළ කාර්ය නිමකල යුතු හෙයින් පෙර වර්ෂවල ඉදිරිපත් වූ සැපයුම්කරුවන් කැඳවා අවශ්‍යතාවය පැහැදිලි කර ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කලෙමි. |
| (ඇ) | පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දකුණු පළාතේ 05 වසර ශිෂ්‍යත්වය සමත් සිසුන් ඇගයීම සඳහා කරන ලද ජය සංඛ සිසු උපහාර වැඩ සටහන සඳහා ශිෂ්‍ය පදක්කම් මිලදී ගැනීමේදී විධිමත් පරිදි ප්‍රසම්පාදන මාර්ගපෝදේශය සහ නීති රීති වලට අනුකූල නොවී සැපයුම්කරුවන් තෝරා ගැනීම හේතුවෙන් 2017 සහ 2018 වර්ෂයන්හිදී රු.1,336,120 ක මූල්‍යමය පාඩුවක් සිදුවී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල විය යුතුය. | 2017 ප්‍රසම්පාදන තීරණය මත අවසන් කරන ලද ගෙවීමක් බැවින් මෙම වසරේ අයකිරීමට කිසිදු හැකියාවක් නොමැත. |

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වියදම් ශීර්ෂ 25 හි ශුද්ධ ප්‍රතිපාදනවලින් එකතුව රු.3,722,820,243 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර,ඒ එක් එක් ශීර්ෂයට අදාළව සලකාබැලීමේදී එම අගයන් රු.757,903 සිට රු.716,517,769 අතර පරාසයක පැවතුණි. | ප්‍රතිපාදන ඉතිරිවීම් අවම මට්ටමකට ලඟා විය යුතුය. | අදහස් දක්වා නොමැත. |

### 5.2 නොවිසඳී ඇති විගණන ඡේද

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 නොවැම්බර් 07 දින පැවති පාර්ලිමේන්තු රාජ්‍ය ගිණුම්කාරක සභාවේ නියෝගය ප්‍රකාරව දකුණු පළාත් අධ්‍යාපන ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය විසින් ලියාපදිංචිය අක්‍රීය සැපයුම්කරුවන්ට ගෙවන ලද එකතු කළ අගය මත බදු මුදල් වහාම අයකර රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවද කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුගෙන් අයකර ගත යුතු වූ එකතුව රු.921,535 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම මුදල අදාළ පාර්ශවයන්ගෙන් කරුණු පැහැදිලි කොට අයකර ගැනීමට කටයුතු කරන අතර නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය වේ නම් ඒ සම්බන්ධයෙන්ද ක්‍රියාකරමි. |